# නූතන ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා බෞද්ධ ආර්ථික කළමනාකරණයේ උපයෝගීතාව

රන්ජනී මලවි පතිරණ [1]

යම් කාර්යයක් මැනවින් ඉටු කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිඵල සාධනයේ දී බෞද්ධ කළමනාකරණ සංකල්පවලින් ලැබෙන්නේ මහා උපයෝගීතාවකි. ආර්ථික දියුණුව සඳහා වෙහෙසෙන පුහුදුන් මිනිසාට තම ආර්ථිකය නිසි ලෙස කළමනාකරණය කර ගැනීම අපහසු වුවහොත් සාර්ථක ජීවිතයක් ගතකිරීම දුෂ්කර ය. නූතන අභියෝග හමුවේ භෞතික දියුණුවේ හිණිපෙත්තට යන්නට වෙර දරණ මිනිසා සමාජ සාරධර්ම අමතක කොට ශීඝ්‍ර ගමනක් යන නමුදු එය අවසන් වන්නේ මහා ඛේදවාචකවලිනි. ඒ පිළිබඳව සාකච්ඡා කොට නූතන ආර්ථික කළමනාකරණයට එමගින් ගතහැකි ආදර්ශ හඳුන්වාදීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ යි. දිළිඳුකම දුකක් බව අංගුත්තර නිකායේ ඉණ සූත්‍රයේ සඳහන් වේ. ධාර්මිකව ආර්ථිකය කළමනාකරණය කර ගන්නා කළමනාකරුවා තුළ උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා හා සමජීවිකතා යන ලක්ෂණ තිබිය යුතු බව අංගුත්තර නිකායේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වේ. දීඝ නිකායේ සිගාල සූත්‍රයට අනුව ආර්ථික වශයෙන් පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු හයකි. තවදුරටත් අංගුත්තර නිකායේ වනිජ්ජා, අණණ හා කුල සූත්‍ර මජ්ඣිම නිකායේ රට්ඨපාල සූත්‍රය, සුත්ත නිපාතයේ වසල හා මංගල සූත්‍ර ධම්මපදපාලිය ආදී ත්‍රිපිටකාගත මූලාශ්‍රයන් ඇසුරින් ද ආර්ථිකය පිළිබඳ බෞද්ධ දර්ශනය සාකච්ඡා කළ හැකි ය. එම ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික ග්‍රන්ථ ආදී සාහිත්‍යයමය මූලාශ්‍රය අධ්‍යයනය කිරීම මගින් කරුණු අනාවරණය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වෙයි. ධන නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරීම හා ඒ පිළිබඳ බෞද්ධ දර්ශනය යනුවෙන් බෞද්ධ ආර්ථික කළමනාකරණයේ මූලික සිද්ධාන්ත හතරක් පවතින බවත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි බවත් පෙන්වා දීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලය යි. බුදුදහමට අනුව නිවැරදිව තම ආර්ථිකය කළමනාකරණය කර ගත් පුද්ගලයා තම ජීවිතය සාර්ථක කර ගන්නා බවත් ඒ උදෙසා ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම් මගින් නූතන ලෝකයට ගැළපෙන ආර්ථික න්‍යායන් වුවද ගොඩනගා ගැනීමට හැකි බවත් මෙම පර්යේෂණය මගින් තවදුරටත් තහවුරු කළ හැකි ය.

යතුරුපද- කළමනාකරණය, ආර්ථිකය, කළමනාකරුවා, බෞද්ධ, සිද්ධාන්ත

[1] රන්ජනී මලවි පතිරණ, සහකාර කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය ,mpranjanee@gmail.com